# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

පළමු වාර පරීක්ෂණය - 2019 මාර්තු

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

10 ශ්‍රේණිය කාලය පැය 03 යි

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✗) ලකුණ යොදන්න.
- එම පිළිතුර පත්‍රය පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා පිළිපදින්න.

---

01. මිනිසා ක්‍රමයෙන් ශිෂ්ටාචාරවත්ම ඔහුගේ අවශ්‍යතා හා වුවමනා ද පුළුල් විය. ක්‍රමයෙන් අතිරික්ත නිෂ්පාදනයක් සිදුවූ අතර අතිරික්තය හුවමාරුව තුලින් අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමට ඔහු හුරු පුරුදු විය.

    මෙම අතිරික්ත නිෂ්පාදිතය බිහිවීමට පදනම් වූ ප්‍රධානතම සාධකය ලෙස දැක්විය හැක්කේ,
    (i) අතිරික්ත නිෂ්පාදනය සිදු කිරීමට අවශ්‍ය සම්පත් පරිසරයේ සුලභවීම යි.
    (ii) සිය දක්ෂතා මත තමාට වඩාත් හොඳින් නිපදවිය හැකි භාණ්ඩ නිපදවීම යි.
    (iii)මිනිස් ශිෂ්ටාචාරයේ දියුණුව මත අවශ්‍යතා හා වුවමනා වර්ධනය වීම යි.
    (iv)භාණ්ඩ හුවමාරුව තුලින් සිය අවශ්‍යතා සපුරා ගත හැකි බව අවබෝධ වීම යි.

02. ''පානීය ජලයට ආසනික් එක්වීම මත පොළොන්නරු දිස්ත්‍රික්කයේ බොහෝ ජනයා වකුගඩු රෝගීන් ලෙස රෝහල්වල ප්‍රතිකාර ගනු ලබයි.''
    ඉහත උපුටා ගැනීමෙන් දැක්වෙන වකුගඩු රෝගීන්ගේ අවශ්‍යතාවයක් වන්නේ,
    (i) සෞඛ්‍ය (ii) විවේකය (iii) බෙහෙත් (iv) රෝහල්

03. ඔවුන්ගේ වුවමනාවක් ලෙස දැක්විය හැක්කේ,
    (i) සෞඛ්‍ය (ii) ආහාර (iii) විවේකය (iv) බෙහෙත්

04. අවශ්‍යතාවයක ලක්ෂණයක් වන්නේ මින් කවරක්ද ?
    (i) අවශ්‍යතා අතිශයින්ම සංකීර්ණ වීම
    (ii) ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ නොහැකි වීම.
    (iii)පුද්ගල ආර්ථික හා සමාජමය තත්වය මත තීරණය වීම
    (iv)අවශ්‍යතා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්වීම

05. මින් නිෂ්පාදන සාධකයක් යනුවෙන් අදහස් කරන්නේ,
    (i) ස්වභාව ධර්මයෙන් ලබාදී ඇති සියලුම සම්පත් ය.
    (ii) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට අවශ්‍ය විවිධ සම්පත් ය.
    (iii)ශ්‍රමය, භූමිය, ප්‍රාග්ධනය, ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර ය.
    (iv)ප්‍රාග්ධන සූක්ෂම හා ශ්‍රම සූක්ෂම යන ව්‍යාපාර ක්‍රම ය.

06. පහත සඳහන් ප්‍රකාශ දෙක සැලකිල්ලට ගෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) පෞද්ගලික අංශයේ ඇතැම් ව්‍යාපාර ලාභ ඉපැයීමෙන් තොරව කටයුතු කරයි.

(2) බොහෝ ව්‍යාපාර ලාභ ඉපැයීමේ අපේක්ෂාවෙන් තොරව කටයුතු කරයි.

(i) පළමු ප්‍රකාශය වැරදිය, එහෙත් දෙවැන්න නිවැරදිය.

(ii) පළමු ප්‍රකාශය හා දෙවැනි ප්‍රකාශය යන දෙකම නිවැරදිය.

(iii) පළමු ප්‍රකාශය හා දෙවැනි ප්‍රකාශය යන දෙකම වැරදිය.

(iv) පළමු ප්‍රකාශය නිවැරදිය. එහෙත් දෙවැනි ප්‍රකාශය වැරදිය.

07. වර්තමාන ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. මෙයට ප්‍රධානතම හේතුව ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද ?

(i) අන්තර් ජාතික වෙළෙඳ කලාප බිහිවීම මත ඇතිවූ වෙළෙඳාමේ දියුණුව යි.

(ii) නවීන තාක්ෂණික උපකරණවල දියුණුව යි.

(iii) කාර්මික විප්ලවය සමග ඇති වූ ව්‍යාපාරවල දියුණුව යි.

(iv) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ඇතිවූ දියුණුව යි.

08. සෑම ව්‍යාපාරයක්ම සුවිශේෂී වූ අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටු කර ගැනීමට උත්සාහ දරනු ලබයි.

මෙයට ප්‍රධානතම හේතුවක් විය හැක්කේ,

(i) අයිතිකරුවන්ගේ ආයෝජනයට ප්‍රතිලාභයක් ලබාදිය යුතු බැවිනි.

(ii) අරමුණු නොමැති විට ඉලක්ක ඉටු කර ගැනීමට අපහසු බැවිනි.

(iii) පාරිභෝගික තෘප්තිය ඉහළ දැමීමට අරමුණු උපකාරී වන බැවිනි.

(iv) ඇල්මැති පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීමට අවශ්‍ය බැවිනි.

09. ව්‍යාපාර පරිසරය වඩාත් හොඳින් හඳුන්වා දී ඇති පිළිතුර තෝරන්න.

(i) ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර වටපිටාව යි.

(ii) ව්‍යාපාරයට සෘජුව බලපෑම් කරනු ලබන පරිසරය යි.

(iii) ව්‍යාපාරයට වක්‍රව බලපෑම් එල්ල කරනු ලබන පරිසරය යි.

(iv) ව්‍යාපාර කටයුතුවලට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන පරිසරය යි.

10. පහත සඳහන් ප්‍රකාශ කියවා නිවැරදි පිළිතුර තෝරන්න.

A ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු බව

B නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගතවීම දුෂ්කර වීම

C ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම

මින් ව්‍යාපාර දුර්වලතාවයක් ලෙස සැලකිය හැක්කේ කවරක්ද ?

(i) A පමණි (ii) B පමණි (iii) A හා B පමණි (iv) A හා C පමණි

11. ව්‍යාපාරයක ආර්ථික පරිසරය නියෝජනය කරන සාධකයකි.

(i) රජයේ අණපනත් හා නීතිරීති

(ii) පොළී අනුපාතිකය අඩු වැඩි වීම

(iii) ගමනා ගමන ක්ෂේත්‍රයේ දියුණුව

(iv) පරිගණක තාක්ෂණයේ දියුණුව

12. පහත සඳහන් කරුණු අතරින් ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,

(i) රජය විසින් අඩු පොලියක් යටතේ ණය ලබාදීම
(ii) ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පැවතීම
(iii) විදේශ විනිමය අනුපාතිකය යහපත් තත්වයක පැවතීම
(iv) උද්ධමන අනුපාතිකය පහළ යාම

13. මින් ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(i) අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයන්
(ii) අයිතිකරුවන්, තරගකරුවන්, සේවකයන්
(iii) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්
(iv) සේවකයන්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්

14. පහත X හා Y තීරුවල පිළිවෙලින් නිෂ්පාදන සාධක හා එයට අයත් නිදසුන් කිහිපයක් දක්වා ඇත.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ශ්‍රමය | A | අයිතිකරු |
| 2. | ප්‍රාග්ධනය | B | මුරකරු |
| 3. | ව්‍යවසාය | C | ගොඩනැගිලි |
| 4. | භූමිය | D | ආලෝකය |

X හා Y තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(i) 1 – A, 2 – B, 3 – C, 4 – D
(ii) 1 – B, 2 – C, 3 – A, 4 – D
(iii) 1 – D, 2 – B, 3 – D, 4 – C
(iv) 1 – C, 2 – D, 3 – C, 4 – A

15. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ඒවා (i) .............................................
(ii) ............................................... ලෙස වර්ග කළ හැකිය. ඉහත (i) හා (ii) යන හිස්තැන්වලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

(i) ලාභ ලබන ව්‍යාපාර, ලාභ නොලබන ව්‍යාපාර
(ii) ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර
(iii) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, සේවා සැපයීමේ ව්‍යාපාර
(iv) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර, සේවා සැපයීමේ ව්‍යාපාර

16. පහත සඳහන් ප්‍රකාශ දෙක සැලකිල්ලට ගෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) පුද්ගලයින් තම ආදායමින් පරිභෝජනය සඳහා වැය නොකරන කොටස ඉතුරුම් වේ.
(2) රටක ඉතුරුම් වර්ධනය නිසා ආයෝජනය පහළ යාම සිදු වේ.

(i) පළමු ප්‍රකාශය හා දෙවන ප්‍රකාශය වැරදි ය.
(ii) පළමු ප්‍රකාශය හා දෙවැනි ප්‍රකාශය නිවැරදි ය.
(iii) පළමු ප්‍රකාශය වැරදි ය. එහෙත් දෙවැන්න නිවැරදි ය.
(iv) පළමු ප්‍රකාශය පමණක් නිවැරදි ය. එහෙත් දෙවැන්න වැරදි ය.

17. ඒක පුද්ගල ව්‍යාපාර ජනප්‍රිය වීමට බලපාන හේතුවක් වන්නේ මින් කවරක් ද?
(i) කුඩා ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි වීම.
(ii) ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
(iii) නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම.
(iv) ලාභ අලාභ තනිව භුක්ති විඳීම.

18. තනි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම තුලින් ව්‍යාපාරයට,
(i) බද්දෙන් නිදහස් විය හැකි ය.
(ii) නීතිමය පුද්ගලභාවයක් ලැබේ.
(iii) අනන්‍යතාවයක් හිමි වේ.
(iv) අඛණ්ඩ පැවැත්මක් හිමි වේ.

19. හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජිකයින් සංඛ්‍යාව තීරණය කර ඇත්තේ,
(i) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත මගිනි.
(ii) 2007 අංක 07 දරණ සමාගම් පනත මගිනි.
(iii) 1954 අංක 14 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත මගිනි.
(iv) 1972 අංක 02 දරණ සමුපකාර සමිති පනත මගිනි.

20. සමුපකාර සමිතියක් ආරම්භ කළ හැකි අවම සාමාජිකයින් ගණන වනුයේ,
(i) 10 කි (ii) 20 කි (iii) 50 කි (iv) 100 කි

21. හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර ඇත්තේ,
(i) ලාභ අරමුණු කරගත් හා ලාභ අරමුණු කර නොගත්,
(ii) සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර
(iii) පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර
(iv) සුළු පරිමාණ හා මහා පරිමාණ ව්‍යාපාර

22. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(i) හවුල්කරුවන්ගේ වගකීම බාහිර පාර්ශවයකට පැවරිය හැක.
(ii) හවුල්කරුවන්ගේ වගකීම අන් අයට පැවරිය හැක.
(iii) හවුල්කරුවන් සාමූහික වශයෙන් වගකීමට බැඳේ.
(iv) හවුල්කරුවන් සාමූහික වගකීමකට බැඳී නොමැත.

23. පහත X තීරුවේ රටවල් ද Y තීරුවේ එම රටවල් භාවිතා කරන මුදල් වර්ග ද දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. චීනය | A. යුරෝ |
| 2. ජපානය | B. යු ආන් |
| 3. ප්‍රංශය | C. වොන් |
| 4. ද.කොරියාව | D. යෙන් |

X තීරුවේ සඳහන් රටවලට අදාල Y තීරුවේ ඇති මුදල් වර්ග අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි තේරීම ඇතුලත් පිළිතුර තෝරන්න.

(i) A,C,B,D
(ii) B,D,A,C
(iii)A,B,C,D
(iv)A,C,D,B

24. සමූපකාර සමිති ලියාපදිංචි කළ යුතු පනත වනුයේ,
(i) 1972 අංක 05
(ii) 2007 අංක 07
(iii) 1890 අංක 24
(iv) 1918 අංක 06

25. ව්‍යාපාර සංවිධානවලට අයත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A අයිතිය හා පාලනය රජය සතුවීම
B අවම සාමාජික සංඛ්‍යාව දස දෙනෙකු වීම
C ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම
D නීතිමය කටයුතුවලදී ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටීම.

මින් දෙපාර්තමේන්තුවලට පමණක් පොදු වූ ලක්ෂණ වන්නේ,
(i) A හා B ය (ii) B හා C ය (iii) C හා D ය (iv) A හා D ය

26. පොල් සංවර්ධන අධිකාරිය අයත් වනුයේ මින් කවර වර්ගයේ ව්‍යාපාර සංවිධානයකටද ?
(i) රාජ්‍ය සමාගම්
(ii) රාජ්‍ය සංස්ථා
(iii) රජයේ දෙපාර්තමේන්තු
(iv) රජයේ වෙනත් ව්‍යාපාර

27. පහත X තීරුවේ ව්‍යාපාර සංවිධාන වර්ගය ද Y තීරුවේ ඊට අදාල නිදසුන් ද දැක්වේ.

| | X | | Y |
|---|---|---|---|
| (1) | ඒක පුද්ගල ව්‍යාපාර | A | ඒකනායක සහ සහෝදරයෝ |
| (2) | හවුල් ව්‍යාපාර | B | සරත් ස්ටෝර්ස් |
| (3) | රාජ්‍ය සංස්ථා | C | ශ්‍රී ලංකා ටෙලිකොම් (පුද්.) සමාගම |
| (4) | රාජ්‍ය සමාගම් | D | ලංකා විදුලි බල මණ්ඩලය |

X හා Y නිවැරදිව ගැලපූ විට පිළිතුරු කාණ්ඩය වනුයේ,
(i) B,A,D,C (ii) B,D,C,A (iii) C,A,B,D (iv) A,B,C,D

28. පහත සඳහන් ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(i) නැනෝ තාක්ෂණය හා ඩිජිටල් තාක්ෂණය සොයා ගැනීම නිෂ්පාදන ක්‍රමවල දියුණුවට ඉවහල් විය.
(ii) පාරිභෝගික ජීවන රටාව නිරන්තරව වෙනස්වීම ව්‍යාපාරවලට තර්ජනයකි.
(iii) බාහිර පරිසරය අධ්‍යනය කිරීම තුලින් ව්‍යාපාරික දුර්වලතා පිළිබඳ අවබෝධයක් ලැබිය හැක.
(iv) දැඩි තරඟකාරීත්වයට මුහුණ දීමට සිදුවීම ගෝලීය පරිසරයේ හිතකර බලපෑමකි.

29. පහත සඳහන් වනුයේ සංස්ථාපිත සමාගම්වල ලක්‍ෂණ කිහිපයකි.

A ඉහළ පිළිගැනීමක් පැවතීම

B නෛතික පුද්ගලභාවයක් පැවතීම

C අඛණ්ඩ පැවැත්මක් පැවතීම

D ප්‍රාග්ධන සම්පාදනය කොටස් නිකුත් කිරීමෙන් සිදු කිරීම

ඉහත ලක්‍ෂණ අතුරෙන් වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගැනීම සඳහා බලපාන හේතු වනුයේ,

(i) A හා B ය. (ii) B හා C ය. (iii) A හා D ය. (iv) A හා C ය.

30. තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කළ යුතු ආයතනය වන්නේ,

(i) අදාල පළාත් සභාව

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(iii) ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලය

(iv) අදාල ප්‍රාදේශීය සභාව

31. පහත සඳහන් වනුයේ ව්‍යාපාර සංවිධාන වර්ග 4 කි.

A රාජ්‍ය සංස්ථා

B හවුල් ව්‍යාපාර

C තනි පුද්ගල ව්‍යාපාර

D රජයේ දෙපාර්තමේන්තු

මින් නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධාන වනුයේ,

(i) A හා B ය (ii) A හා D ය (iii) B හා C ය (iv) A හා C ය

32. ව්‍යාපාරයේ පාලනයට හසුවන පරිසරය කුමක්ද ?

(i) තාක්‍ෂණික පරිසරය

(ii) ආර්ථික පරිසරය

(iii) දේශපාලන පරිසරය

(iv) අභ්‍යන්තර පරිසරය

33. පහත සඳහන් කරුණු අතරින් දෙපාර්තමේන්තු ක්‍රමයේ වාසියක් වන්නේ,

(i) පහසුවෙන් ආරම්භ කළ හැකිවීම.

(ii) අනෙකුත් ව්‍යාපාර හා සසඳන කල පාලනය පහසුව.

(iii) අවශ්‍ය විටක වසා දැමිය හැකි බව.

(iv) ලාභ අපේක්‍ෂාවෙන් තොරව මහා පරිමාණ සේවා සැපයීම.

34. තනි පුද්ගල ව්‍යාපාර හා සසඳන විට හවුල් ව්‍යාපාරයක අවාසියක් වන්නේ,

(i) ආරවුල් ඇති නොවීම හෝ අවම වීම.

(ii) ලාභය හවුල්කරුවන් අතර බෙදීයාම.

(iii) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම.

(iv) නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම.

35. සංස්ථාපිත සමාගම්වලට නීතිමය පුද්ගලභාවය හිමිවීම තුල,
   (i) වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැක.
   (ii) වගකීම සීමා සහිත වේ.
   (iii) නීතිමය විධි විධාන අධික වේ.
   (iv) සමාගම නමින් වත්කම් අත්පත් කර ගත හැක.

36. පහත සඳහන් ව්‍යාපාර සංවිධාන අතුරින් ආයතන සංග්‍රහයට අනුවම කටයුතු කිරීම අවශ්‍ය වන්නේ,
   (i) හවුල් ව්‍යාපාර වලට ය.
   (ii) සමූපකාර සමිති වලට ය.
   (iii) සමිති සමාගම් වලට ය.
   (iv) රජයේ දෙපාර්තමේන්තුවලට ය.

37. ඒක පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කිරීමට අදාල ගාස්තු නියම කිරීම සිදුවන්නේ,
   (i) සමාගම් රෙජිස්ටාර්වරයාගේ නියමයන්ට අනුව ය.
   (ii) ග්‍රාම සේවා නිලධාරීගේ නියමයන්ට අනුව ය.
   (iii) ඒ ඒ පළාත් සභාවලට පැවරී ඇති බලතල අනුව ය.
   (iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නියමනයන්ට අනුව ය.

38. ''අනෙකුත් ව්‍යාපාර හා සාපේක්ෂව බලන කල සමූපකාර ව්‍යාපාරය, ව්‍යාපාර ලෝකය හා තරග වැදීම අපහසු වී තිබේ.''
   මෙයට ප්‍රධාන හේතුව ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද ?
   (i) සමූපකාර ව්‍යාපාරවලට ප්‍රාග්ධන සම්පාදන මාර්ග සීමිත වීම
   (ii) සමූපකාර සමාජයීය සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම
   (iii) සමූපකාරවල ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පැවතීම
   (iv) සමූපකාර ප්‍රතිපත්ති මතම කටයුතු කිරීමට සිදුවීම

39. රාජ්‍ය සංස්ථා ඇතැම් විට පෞද්ගලික අංශයේ ව්‍යාපාරවලට තරගයක් ලබා දේ.
   රජය මින් බලාපොරොත්තු වනුයේ කුමක් ද ?
   (i) අත්‍යාවශ්‍ය සේවා සම්පාදනය.
   (ii) පෞද්ගලික අංශය ඉදිරිපත් නොවන සේවා සැපයීම.
   (iii) පෞද්ගලික අංශයේ ඒකාධිපති පාලනයේ ප්‍රති විපාක අවම කිරීම.
   (iv) පෞද්ගලික අංශය ලබා ගන්නා ලාභයෙන් කොටසක් රජයට අත්පත් කර ගැනීම

40. අයිතිකරු කළමනාකරු හා නායකයා එකම පුද්ගලයකු ලෙස පෙනී සිටිනුයේ මින් කවර ව්‍යාපාර සංවිධාන වර්ගයකද ?
   (i) හවුල් ව්‍යාපාර
   (ii) කේවල ස්වාමි ව්‍යාපාර
   (iii) රාජ්‍ය සංස්ථා
   (iv) සමූපකාර